ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

විද්‍යාවේදී උපාධි පාඨමාලාව - 4 වන මට්ටම

අවසාන පරීක්ෂණය - 2006

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතිය **II - LWU 2314**

කාලය - පැය යි

---

දිනය - 2006.04.08 වේලාව - පෙ.ව.09.30 - ප.ව.12.30 දක්වා

---

*එක් කොටසකින් ප්‍රශ්න 2 ක් තෝරාගෙන ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න. අපැහැදිලි අත් අකුරුවලට ලකුණු අඩු කරනු ලැබේ.*

## *I කොටස - මූලික අයිතිවාසිකම්*

*මෙම කොටසින් යටත් පිරිසෙයින් ප්‍රශ්න 2 කට පිළිතුරු සපයන්න.*

01. සුනාමියෙන් විපතටපත් ජනතාවට නිවාස ලබාදීම සඳහා "සුනාමි නිවාස මණ්ඩලය" **(THB - Tsunami Housing Board)** ජනාධිපතිවරයා විසින් පිහිටුවන ලදී. **THB** හි අධ්‍යක්ෂක මණ්ඩලය අධ්‍යක්ෂකවරු 7 දෙනෙකුගෙන් සමන්විත අතර ඉන් 4 දෙනෙකු සමාජ හා සුභසාධන අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබීය. ඉතිරිය සුනාමි නිවාස ව්‍යාපෘතින් හි නිරත රාජ්‍ය නොවන සංවිධානවලින් **(NGOs)** පත් කරනු ලැබේ. නිවාස ඉදිකිරීමට හා මණ්ඩලයේ ක්‍රියාකාරිත්වයට අවශ්‍ය මුදල් සුනාමි නිවාස අරමුදලින් සම්පාදනය වේ. සුනාමි නිවාස අරමුදලින් 45% කට සමාජ හා සුභසාධන අමාත්‍යාංශය දායක වන අතර තවත් 45% කට සුනාමි සහන සඳහා ක්‍රියාත්මක වන රාජ්‍ය නොවන සංවිධානවලින් එකතු කරන මුදල් වලින් සම්පාදනය වේ. ඉතිරි 10% නිවාස හා යටිතල පහසුකම් අමාත්‍යාංශයෙන් ලබා දේ. සුනාමියෙන් විනාශ වූ නිවාස නැවත ගොඩනැගීම සඳහා රටතුළ ක්‍රියාත්මක එකම ආයතනය මෙය වේ.

    සුනාමියෙන් විපතට පත් ජනතාවට සහන සැලසීම ආණ්ඩුවේ ප්‍රධානතම අරමුණක් බව ජනාධිපතිවරයා ප්‍රකාශ කළේය.

    පැරැලියේ ජීවත් වන සමන්ගේ නිවස සුනාමියෙන් විනාශ විය. සුනාමි නිවාස මණ්ඩලයෙන්, ප්‍රදේශයේ නිවාස ලබාදීමට සකස් කරන ලද ලැයිස්තුවට තමන්ගේ නිවස ඇතුළත්නොවූ බව සමන්ට දැන ගන්නට ලැබුණු අතර සුනාමි නිවාස මණ්ඩලයට **(THB)** එරෙහිව මූලික අයිතිවාසිකම් නඩුවක් පැවරීමට ඔහු අදහස් කරයි.

    සමන්ගේ නඩුකරය සාර්ථකවේදැයි ඔබ සිතන්නේ ද? විනිශ්චිත තීන්දු සඳහන් කරමින් ඔබේ පිළිතුරට හේතු දක්වන්න.

02. "සෑම ශිෂ්ඨසම්පන්න සමාජයක්ම කෲර ක්‍රියාකාරිත්වයන් තහනම් කර ඇත. කෲර හෝ අමානුෂික සැලකීම් වලින් නිදහස්වීමේ අයිතියේ මූලික ස්වභාවය ඇති කර ඇත්තේ එය මොනයම් සීමාවකට හෝ කුමන තත්ත්වයක් යටතේ පහත් ස්වභාවයකට යටත්නොවන තීරණාත්මක අයිතියක් බවට තීව්‍ර කර දැක්වීමෙනි...."

**Fundamental Rights in Sri Lanka - a commentary by Justice S.Sharvananada at page 69**

මනුෂ්‍ය ගරුත්වය සඳහා මූලික අයිතිවාසිකම් ක්‍රියාත්මක විය යුතුය යන්න කෙරෙහි අවධානය යොමුකරමින් මෙම ප්‍රකාශය සාකච්ඡා කරන්න

03. "කපුටා" පුවත් පතේ ප්‍රධාන කාටූන් චිත්‍ර ශිල්පියා වන බර්ටි, විසින් අඳින ලද කාටූන් චිත්‍රයක් හේතුවෙන් එම පුවත් පත තහනම් කිරීමට රජය උත්සාහ කරමින් සිටින බව දැනගන්නට ලැබීමෙන් පසුව එම පුවත් පතේ කාර්යය මණ්ඩලය සමඟ එක් වූ බර්ටි උද්ඝෝෂණයක නිරත වී සිටියේ ය. උද්ඝෝෂණ කරුවන් පෝස්ටර්, බැනර් ආදිය ප්‍රදර්ශනය කළ අතර සමහර කාර්ය මණ්ඩල සාමාජිකයින් විසින් බෙර වාදනය කරමින් උද්ඝෝෂණය දිරි ගැන්විය. "කපුටා" පුවත්පතේ කවි පිටුවේ සංස්කාරක වන සිල්වා විසින් ලියන ලද කවි සහිත අත් පත්‍රිකා ද උද්ඝෝෂණ කරුවන් අත විය. ඔවුන් කවි ගායනයට අනුව නටමින් ද සිටියේ ය. උද්ඝෝෂණය අතරතුර පොලිසිය විසින් උද්ඝෝෂණ කරුවන්ට පහර දී පෝස්ටර්, බැනර් සහ බෙර විනාශ කරනු ලැබිය. තවද පුවත්පත් කාර්යාලයට අයත් චන්ද්‍රිකා හුවමාරු ඇන්ටනාවට ද **(The satellite disk antenna)** පොලිසිය හානි කරන ලදී. පොලිසිය කළ සියළුම පහරදීම්වලට එරෙහිව නඩු පැවරීමට බර්ටි, සිල්වා සහ පුවත්පතේ අනෙකුත් කාර්යය මණ්ඩලය අදහස් කරයි.

ඔවුන්ගේ නඩුකරය සාර්ථක වේදැයි යන්න පිළිබඳ වාර්තාවක් සකස් කරන්න.

04. ලෝකය වඩාත් අසමාන තැනක් බවට පත්වන විට මිනිසුන් අතර සමානාත්මතාවයක් බිහිකර ගැනීම අසීරු කරුණක් වේ. එමනිසා ලෝකය අසමානතාවයන් පවත්වා ගෙන යායුතු වේ. එහෙත් නීතිය මගින් අසමානතාවයන් අවශ්‍ය විටදී, සියළු දෙනා සමාන ලෙස සැලකිය යුතු වේ.

ඔබ මේ ප්‍රකාශය සමඟ එකඟ වන්නේ ද? සමානාත්මතාව අයිතියේ මූලධර්මයන්ගේ උදාහරණ සහ විනිශ්චිත නීන්දු සැලකිල්ලට ගනිමින් සාකච්ඡා කරන්න.

## II වන කොටස - බලය බෙදීම

මෙම කොටසින් යටත් පිරිසෙයින් ප්‍රශ්න දෙකකට පිළිතුරු සපයන්න.

05. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට කරන ලද 13 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් ජනතාවගේ අධිකරණ බලය කෙරෙහි වැදගත් වෙනස්කම් රාශියක් ඇතිකළ බව ඇතැමුන් අදහස් කරයි. කෙසේ වෙතත්, පෙනී යන කරුණක් වන්නේ 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් බෙදන ලද බලය නැවත සකස් කිරීමක් පමණක් කර ඇති බව යි. 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අරමුණ වූයේ ජනතාවට යුක්තිය වඩාත් සමීප කරවීම බව ඉහත මතය දිරිගන්වන්නක් වේ.

ඔබ මේ ප්‍රකාශය සමඟ එකඟ වන්නේ ද? විනිශ්චිත තීන්දු ඉදිරිපත් කරමින් ඔබේ පිළිතුරට හේතු දක්වන්න.

06. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට කරන ලද 13 වන සංශෝධනය මගින් 1978 දෙවන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික රාමුව විනාශ කර දමන බවටත් එමගින්, ජනතාවගේ ව්‍යවස්ථාදායක බලයට හා විධායක බලයට එමගින් බලපෑමක් කිරීමට හේතු වී ඇති බවට ද තර්ක කරයි. මෙම සංශෝධනය මගින් 1978 ව්‍යවස්ථාවේ 82 (1) ව්‍යවස්ථාව, 2 ව්‍යවස්ථාව සහ 3 ව්‍යවස්ථාවට පටහැනි තත්ත්වයක් ඇති කර ඇති අතර එමගින් ව්‍යවස්ථාව අවතක්සේරුවට ලක් කර ඇති බවට ද තර්ක කර ඇත. 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ පසුකාලීන අත්දැකීම් ඇසුරින් මෙම ප්‍රකාශයේ නිවැරදි භාවය විශ්ලේෂණය කරන්න.

07. පළාත් සභාවන්ගේ ව්‍යවස්ථාදායක බලය තවමත් රැඳී ඇත්තේ මධ්‍යම රජයේ ව්‍යවස්ථාදායක ස්වාධිපත්‍ය නැමති සංකල්පය තුළ වේ. පළාත් සභාවේ බලය කිසිදු ආකාරයේ හරයාත්මක සීමාවන්ගෙන් බැඳී නොමැති මධ්‍යම ව්‍යවස්ථාදායකයේ බලය මත රඳා පවතී.

ඔබ මේ ප්‍රකාශය සමඟ එකඟ වන්නේ ද? ඔබේ පිළිතුරට හේතු දක්වන්න.

08. බලය බෙදීම පිළිබඳ පර්යේෂණ කරන පර්යේෂණ කණ්ඩායමක සාමාජිකයෙකු වන පියල්ගෙන්, පහත සඳහන් සංකල්පයන් විශ්ලේෂණය කරන ලෙස පර්යේෂණ කණ්ඩායම් නායකයා ඉල්ලා සිටී. ෆෙඩරල්වාදය, විමධ්‍යගතකරණය හා විකේන්ද්‍රණය එම සංකල්පයන් වේ.

පියල් වෙනුවෙන්, මෙම සකල්පයන් බලය බෙදීම යන සංකල්පය සමඟ සංසන්දනය කරමින් විශ්ලේෂණයක් ඉදිරිපත් කිරීම ඔබගෙන් බලාපොරොත්තු වේ. උදාහරණ දක්වමින් ඔබේ වාර්තාව ලියා දක්වන්න.

\- හිමිකම් ඇවිරිණි. -